# එළවළු සැපයුම් ක්‍රියාදාමයේ දී සුපිරි වෙළෙඳසැල් මඟින් අතරමැදිකරණය වැළැක්වීම

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල විශේෂයෙන් ම, කොළඹ හා අවට ප්‍රදේශවල ආහාර පරිභෝජනය සහ මිල දී ගැනීමේ ක්‍රියාවලියේ දී සුපිරි වෙළෙඳසැල් සඳහා පවතින ඉල්ලුම දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. සුපිරි වෙළඳසැල් තුළ අලෙවිය සඳහා මස්, මාළු, එළවළු, පලතුරු, කිරි නිෂ්පාදන, බේකරි නිෂ්පාදන, ඇසුරුම් කරන ලද ආහාර, විවිධ වූ සකස් කළ ආහාර සහ සත්ත්ව ආහාර මෙන් ම ආහාරමය නොවන භාණ්ඩ රාශියක් එකම වහලක් තුළ දී මිල දී ගැනීමට පාරිභෝගිකයන්ට අවස්ථාව සැලසී ඇත. ශ්‍රී ලංකාව තුළ දැනට පුද්ගලික අංශය මගින් සුපිරි වෙළෙඳසැල් ජාලයන් කිහිපයක් ක්‍රියාත්මක කොට ඇති අතර මේවායෙ හි සීඝ්‍ර ව්‍යාප්තියක් දක්නට ලැබුණේ වසර 2000න් පසුව ය. දැනට, කාගිල්ස් ෆුඩ්සිටි සහ කීල්ස් සුපර් යන සුපිරි වෙළෙඳසැල් ප්‍රමුඛ ව ක්‍රියාකරන අතර ඊට අමතරව ලාෆ් සන් අප් සහ ආර්පිකෝ සුපර් සෙන්ටර් වැනි සුපිරි වෙළෙඳසැල් ද, ප්‍රධාන නගර ආශ්‍රිත ව බිහිවෙමින් පවතී. මේ වන විට දිවයින පුරා අලෙවිසැල් 240ක් පමණ දක්නට ලැබෙන අතර ඉන් 123ක් පමණ කොළඹ නගරය තුළ දක්නට (වගුව 01) ලැබේ. සුපිරි වෙළෙඳසැල් හරහා මිල දී ගැනීම් සිදුකරන ආකාරය පමණක් නොව නව මිල දී ගැනීමේ ක්‍රම හරහා ආහාර ද්‍රව්‍ය සැපයුම් ක්‍රියාදාමය, නිෂ්පාදකයා හා සිල්ලර වෙළෙන්දා අතර පවතින සම්බන්ධතාවය වර්තමානය වන විට නවීකරණය වී ඇත.

වගුව 01

ප්‍රධාන සුපිරි වෙළෙඳසැල් වර්ග සහ ඒවායෙ හි ශාඛා

| සුපිරි වෙළෙඳසැල් | මුළු ශාඛා ප්‍රමාණය | කොළඹ දිස්ත්‍රික්කය |
|---|---|---|
| කාර්ගිල්ස් | 140 | 54 |
| කීල්ස් සුපර් | 62 | 39 |
| ලාෆ් සන් අප් | 28 | 24 |
| ආර්පිකෝ සුපර්සෙන්ටර් | 10 | 06 |
| එකතුව | 240 | 123 |


### සුපිරි වෙළෙඳසැල් මගින් එළවළු මිල දී ගැනීම සහ බෙදා හැරීම සිදුවන ආකාරය

ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන සුපිරි වෙළෙඳසැල් මගින් එළවළු මිල දී ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි. කාර්ගිල්ස්, කීල්ස් සුපර් සහ ලාෆ් සන් අප් වැනි ප්‍රධාන සුපිරි වෙළෙඳසැල් හි ප්‍රධාන තොග බෙදාහැරීමේ මධ්‍යස්ථාන (Distribution centers) කොළඹ දිස්ත්‍රික්කයේ වත්තල, පෑලියගොඩ සහ මාදිවෙල යන ප්‍රදේශයන් හි පිළිවෙළින් පිහිටුවා ඇත. ශාඛා විශාල සංඛ්‍යාවක් ඇති සුපිරි වෙළෙඳසැල් සඳහා (කාර්ගිල්ස් සහ කීල්ස්) ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ ආශ්‍රිතව එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර කාර්ගිල්ස් ආයතනය සඳහා එවැනි එකතු කිරීමේ මධ්‍යස්ථාන හයක් නුවරඑළිය, බණ්ඩාරවෙල, හඟුරන්කෙත, තඹුත්තේගම, තණමල්විල සහ නොරොච්චෝලේ ප්‍රදේශවල පිහිටුවා ඇත. කීල්ස් ආයතනය සඳහා තඹුත්තේගම පමණක් ඔවුන්ගේ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති අතර ඔවුන් සඳහා එළවළු එකතු කිරීමේ ස්වාධීන ආයතන දෙකක් නුවරඑළිය ප්‍රදේශයේ දක්නට ඇත. දිවයින පුරා විහිදී ඇති ශාඛා (Retail outlets) වලින් දෛනිකව අවශ්‍ය වන එළවළු ප්‍රමාණය ඔවුන්ගේ එදිනෙදා විකුණුම් ප්‍රමාණය අනුව ගණනය කරනු ලබන අතර අවශ්‍ය එළවළු වර්ග සහ ඒවායෙහි ප්‍රමාණයන් පිළිබඳව වාර්තාවක් ප්‍රධාන බෙදාහැරීමේ මධ්‍යස්ථානය වෙත නිකුත් කරනු ලබයි. එම මධ්‍යස්ථානය මගින් ඔවුන්ගේ එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත හෝ සැපයුම්කරුවන් වෙත ඇණවුම් ප්‍රමාණය දන්වනු ලැබේ. මෙම ක්‍රියාවලිය දෛනිකව සිදුවන්නකි. එකතු කිරීමේ මධ්‍යස්ථාන මගින් දෛනිකව අවශ්‍ය එළවළු ගොවියන්ගෙන්, ගොවි සංවිධාන සහ එකතු කරන්නන්ගෙන් (collectors) සෘජුවම මිල දී ගැනීම සිදු කරනු (සටහන 01) ලබයි. එකතු කිරීමේ මධ්‍යස්ථාන තුළ ඔවුන් සමග ගනුදෙනු කරනු ලබන ගොවියන්ගේ සහ එකතු කරන්නන්ගේ නාම ලේඛණයක් ඇති අතර අවශ්‍යතාවය මත ඔවුන් දුරකථන ඔස්සේ සම්බන්ධ කොටගෙන එළවළු ඇණවුම් කිරීම සිදු කරයි. එකතු කිරීමේ මධ්‍යස්ථාන තුළ සිටින නිලධාරීන් සහ ඔවුන්ගේ සේවකයින්, ගොවියන් විසින් ගෙන එනු ලබන එළවළු වර්ගීකරණය සහ තේරීම සිදුකරනු ලබයි. සාමාන්‍යයෙන් එකතු කිරීමේ මධ්‍යස්ථාන සඳහා ගොවීන් උදෑසනම එළවළු රැගෙන ඒම සිදුකරන අතර ඔවුන් ඉදිරියේ දී ම එළවළු වර්ගීකරණය සිදුකරනු ලබයි. ගොවියන් විසින් ත්‍රීරෝද රථ සහ අත් ට්‍රැක්ටර් මගින්

මෙම මධ්‍යස්ථාන වෙත එළවළු රැගෙන ඒම සිදු කෙරේ. එළවළු වර්ගීකරණය සහ තේරීමේ දී ඒවායෙහි භෞතික ලක්ෂණ වන ප්‍රමාණය, පැහැය, මතුපිට ස්වභාවය සහ කෘමි හානි පිළිබඳව සැලකිල්ල යොමු කරන අතර පළුදු වූ, කෘමි හානි සිදු වූ සහ නියමිත ප්‍රමාණය නොමැති එළවළු ඉවත් කරනු ලබයි. එම තොග ගොවීන් විසින් නැවත රැගෙන යාම සිදු කෙරේ. කාලයක් තිස්සේ සුපිරි වෙළෙඳසැල් සමග ගනුදෙනු කරනු ලබන ගොවීන්ට ඔවුන් අපේක්ෂා කරන එළවළුවල ගුණාත්මක තත්ත්වය පිළිබඳව වැටහීමක් ඇති නිසා අපතේ යන ප්‍රමාණය අවම කර ගැනීමට හැකි වී ඇත. එකතු කිරීමේ මධ්‍යස්ථානවල දී ගුණාත්මක බවින් ඉහළ එළවළු ප්ලාස්ටික් ඇසුරුම්වල අසුරන අතර සුපිරි වෙළෙඳසැල් ඔවුන්ගේ ශීත පහසුකම් සහිත ප්‍රවාහන රථ මගින් එකතු කිරීමේ මධ්‍යස්ථාන වල සිට කොළඹ පිහිටි තොග බෙදා හැරීමේ මධ්‍යස්ථාන වෙත පැය 24කට වඩා අඩු කාලයක් තුළ දී ප්‍රවාහනය කරනු ලබයි. මෙසේ ගුණාත්මක බවින් ඉහළ එළවළු පමණක් තෝරා ගැනීමත්, ඒවා ප්ලාස්ටික් ඇසුරුම්වල බහා ශීත පහසුකම් සහිත රථවල ඉතා ඉක්මනින් ප්‍රවාහනය කිරීමත්, අතරමැදිකරණයෙන් තොරව ගොවියන්ගෙන් සෘජුව ම මිල දී ගැනීමත් නිසා සුපිරි වෙළෙඳසැල්වල අලෙවි දාමයන් මගින් පසු අස්වනු හානිය 5%ක පමණ අවම මට්ටමක පවත්වා ගැනීමට හැකියාව සැලසී ඇත.

ශාඛා අඩු සංඛ්‍යාවක් ඇති සුපිරි වෙළෙඳසැල් ජාලයන් සඳහා එළවළු සැපයීම සඳහා විශේෂිත සැපයුම්කරුවන් (Preferred suppliers) දක්නට ලැබේ. සුපිරි වෙළෙඳසැල් ඔවුන්ට අවශ්‍ය එළවළු ප්‍රමාණය, මෙම සැපයුම්කරුවන් වෙත දන්වන අතර ඔවුන් ගොවියන්ගෙන් සහ එකතු කරන්නන්ගෙන් එළවළු මිල දී ගැනීම සිදු කරයි. මේ සඳහා ඔවුනගේ ම ප්‍රවාහන පහසුකම් (ශීත පහසුකම් සහිත රථ හෝ එම පහසුකම් නොමැති රථ) යොදා ගනී. මෙසේ මිල දී ගනු ලබන එළවළු කොළඹ හා අවට පිහිටි ශාඛාවලට සෘජුව ම හෝ තොග බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට බෙදා හරිනු ලබයි. මෙම විශේෂිත සැපයුම් කරුවන් දෛනිකව එළවළු සැපයීමක් සිදු නො කරන අතර සතියකට 3-4 වතාවක් පමණ එළවළු සැපයීම සිදු කරයි.

දැනට, රට තුළ 90%කටත් වඩා එළවළු අලෙවිකරණය සිදුවන්නේ සාම්ප්‍රදායක මාර්ග හරහා වන අතර සුපිරි වෙළඳසැල් මගින් සිදුවන ප්‍රමාණය 10%කට වඩා අඩු මට්ටමක පවතී. සාම්ප්‍රදායික අලෙවිකරණ රටාව තුළ නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා ගමන් කිරීමේ විවිධ වූ අලෙවිකරණ මාර්ග දක්නට ලැබෙන අතර එළවළු රැස්කිරීම, ඇසුරුම් කිරීම, ප්‍රවාහනය සහ විකිණීම වැනි විවිධාකාර වූ කාර්යයන් රාශියක් විවිධ වූ පාර්ශවකරුවන් (නිෂ්පාදකයින්, තොග වෙළෙඳුන්, සකස්කරන්නන්, අපනයනකරුවන්, ආයතනික මට්ටමේ මිල දී ගන්නන් සහ සිල්ලර වෙළෙඳුන්) විසින් සිදුකරනු ලබයි. එසේම, එළවළු ප්‍රවාහනය සඳහා දැල් උර බහුලව භාවිතා කිරීම සහ ප්‍රවාහනයේ දී සිදුවන අනෙකුත් හානි නිසා සාම්ප්‍රදායික අලෙවි මාර්ග තුළ පසු අස්වනු හානිය ඉහළ මට්ටමක පවතී.




සටහන 01 : සුපිරි වෙළෙඳසැල් මගින් එළවළු මිලදී ගැනීම සහ බෙදාහැරීම සිදුවන ආකාරය

සුපිරි වෙළෙඳසැල් සඳහා ගුණාත්මක බවින් ඉහළ එළවළු පමණක් සැපයීම නිසා ගොවීන්ට අනෙකුත් අලෙවි මාර්ගවලට සාපේක්ෂව තම නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගැනීමට හැකියාව ලැබේ. එසේම, සුපිරි වෙළෙඳසැල් මගින් සිදුකරනු ලබන අලෙවිකරණ ක්‍රියාවලිය තුළ සාම්ප්‍රදායික අලෙවිකරණ ජාලයන්ට සාපේක්ෂව වෙළෙඳපොළ ආන්තිකයන් අවම කරගැනීමට හැකි වී ඇත.


**රුවිනි විදානපතිරණ**

*පර්යේෂණ නිලධාරිණී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය